# "ලංකාවේ සුබ අනාගතයක දැක්ම"

## මහින්ද චින්තන දර්ශනය පසක් කර ගැනීමේ මාවත

## හැඳින්වීම

''මහින්ද චින්තනය : සුබ අනාගතයක දැක්ම'' නම් වූ 2010 වර්ෂයේ ජනාධිපති මැතිවරණ ප්‍රකාශනයෙහි මූලික අවධානය ලංකාවේ මැදිකාලීන ආර්ථික සෞභාග්‍යය අත්පත් කර ගැනීමයි. යුද්ධයේ අවසානය තුළින් විවෘත ආර්ථික ක්‍රමයෙහි ප්‍රතිලාභ ඉහළ මට්ටමින් ළඟා කර ගැනීමට ඉඩ ප්‍රස්තාවද ලැබී ඇත. ඒ සමගම ලෝක ආර්ථික අර්බුදයෙහි නිමාවද මෙම ඉඩ ප්‍රස්ථාව තව දුරටත් පුළුල් වීමට හේතු වී තිබේ. ඒ අනුව, ලංකාවට දශක ගණන් බලාපොරොත්තුව සිටි ආර්ථික සෞභාග්‍යය කරා වේගයෙන් ළඟා වීමේ දුර්ලභ අවස්ථාවක් උදා වී තිබේ. කෙසේ වෙතත්, මෙම ආර්ථික පුනරුදය ''වේගවත් කිරීමට හෝ වේගය බාල කිරීමට'' මෙන්ම, ''තිරසාරව පවත්වා ගැනීමට හෝ කෙටි කාලයකින් නිමා කර දැමීමට'' හැකියාව ඇත්තේ අප විසින් තෝරාගනු ලබන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියටයි.

මැතිවරණ ප්‍රකාශනයෙහි දැක්වෙන ප්‍රතිපත්ති අගැයීමට ලක් කරමින්, මහින්ද චින්තන දැක්ම වූ ආර්ථික සෞභාග්‍යය සඳහා ප්‍රතිපත්ති සම්පාදනය හා ප්‍රතිසංස්කරණය සඳහා අත්වැලක් සැපයීම මෙම ප්‍රතිපත්ති සමාලෝචනයෙහි අරමුණයි. මෙම කාර්යයෙහි දී මුලින්ම අවධාරණය කළ යුත්තේ යහපත් ආර්ථික ප්‍රතිපත්ති කෙටිකාලීන ජනප්‍රිය දේශපාලනය සමග නොගැලපෙන බවයි. එමෙන්ම, ජනප්‍රිය ආර්ථික ප්‍රතිපත්ති දිගුකාලීන යහපත් දේශපාලනය සමඟ ද නොගැලපේ. ඒ අතරම ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය ඉක්මනින් ක්‍රියාත්මක කරන තරමට හොඳ වේ. මෙයට හේතුව එබඳු ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියකට දේශපාලනික සහාය අවශ්‍ය වන බැවින්, රජයකට ඉහළ මට්ටමේ දේශපාලනික ජනප්‍රියතාව පවතින මොහොතේ ඒවා ක්‍රියාත්මක කළ යුතු වීමයි. එසේ නොවන්නේ නම් දේශපාලන අභිප්‍රායන් කුමක් වුවත්, කාලයත් සමඟ දේශපාලන ජනප්‍රියතාව දිය වී යයි. එය වළක්වා ගත හැක්කේ දිගු කාලීනව යහපත් ආර්ථික ප්‍රතිලාභ ගලා එන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ අනුගමනය කිරීම තුළිනි.

| තෝරාගත් ආසියාතික රටවල ඒකපුද්ගල ආදායම (ඇමෙරිකානු ඩොලර්) | | | |
|---|---|---|---|
| | 1960 | 1980 | 2005 |
| ඉන්දියාව | 68 | 207 | 720 |
| පකිස්ථානය | 76 | 259 | 690 |
| තායිලන්තය | 95 | 716 | 2750 |
| ශ්‍රී ලංකාව | 152 | 255 | 1160 |
| දකුණු කොරියාව | 152 | 1528 | 15830 |
| මැලේසියාව | 280 | 1715 | 4960 |
| සිංගප්පූරුව | 428 | 4592 | 27490 |

Source: World Bank, *World Development Reports*

ලංකාවට සැමවිටම බස් එක වැරදුනි

ලංකාවේ සංවර්ධන ඉතිහාසය ''මගහැරී ගිය ඉඩ ප්‍රස්තා'' පිළිබඳ කතාන්තරයකි. 1960 දී එහි ඒක පුද්ගල ආදායම දකුණු කොරියාවේ ඒක පුද්ගල ආදායමට සමානය. පළමු අවුරුදු 20 ක කාලය තුළ (1960-1980), ලංකාවේ ඒක පුද්ගල ආදායම දෙගුණයකින්වත් වැඩි වූයේ නැති නමුත්, දකුණු කොරියාවේ ඒක පුද්ගල ආදායම 10 ගුණයකින් වැඩි විය. ඊළඟ අවුරුදු 25 තුළදී (1980-2005), ලංකාවේ ඒක පුද්ගල ආදායම 4 ගුණයකින් වැඩි වූ අතර, දකුණු කොරියාවේ ඒක පුද්ගල ආදායම නැවතත් 10 ගුණයකින් වැඩි විය. පසුගිය දශක කීපය තුළදී ආසියාවේ බොහෝ රටවල් ලංකාව පසු කරගෙන වර්ධනය වූ අතර, ලංකාවට බොහෝ පසුපසින් සිටි එහි දකුණු ආසියාතික අසල්වැසි රටවල් ද ලංකාව ආසන්නයට පැමිණ ඇත.

# සෞභාග්‍යයේ දෙවැදෑරුම් පදනම්

මැතිවරණ ප්‍රකාශනයෙහි දක්වෙන පරිදි, ලංකාවේ මැදිකාලීන ආර්ථික සෞභාග්‍යය පිළිබඳ අපේක්ෂාව ගොඩ නැගී ඇත්තේ කුලුණු දෙකක් මතය. පළමුවැන්න, ලංකාව ''ගතික ගෝලීය කේන්ද්‍රස්ථානයක්'' බවට පරිවර්තනය වීමයි. දෙවැන්න, ''ලෝකය ජයග්‍රහණය කළහැකි දේශීය ව්‍යවසායකත්වයක්'' නිර්මාණය වීමයි. මෙම කරුණු දෙකෙන්ම අනාවරණය වන මූලික අදහස නම් ලංකාවේ විවෘත ආර්ථිකය ශක්තිමත් වියයුතු බවයි. ඇත්තෙන්ම, අවශේෂ ලෝකයට දැඩිලෙස සම්බන්ධ නොවූ ගෝලීය කේන්ද්‍රස්ථානයක් පැවතිය නොහැකිය. එමෙන්ම, ලෝක වෙළඳපොළට යොමු නොවූ ව්‍යවසායකත්ව දියුණුවක් ද පැවතිය නොහැකිය.

# ලංකාව ගෝලීය කේන්ද්‍රස්ථානයක් වශයෙන්...

දේශීය ව්‍යවසායකයින් ජාත්‍යන්තර කරණයට මුහුණ දිය හැකි සේ වර්ධනය විය යුතුය. ඒ අනුව ඔව්හු ජාත්‍යන්තර වෙළඳපොළට පිවිසීමෙන් දේශීය ආර්ථිකය පුළුල් කරනු ඇත. කෙසේ වෙතත්, මෙහි වැරදි උපකල්පනය නම් එවන් දේශීය ව්‍යවසායකත්වය ගොඩ නැගෙන්නේ ''රජයේ සහායයෙන් '' මිස ''ප්‍රතිපත්ති පරිසරය'' තුළ නොවන බවයි. අනෙක් අතට දේශීය ව්‍යවසායක පන්තිය ගොඩනැගීම ''දිගුකාලීන'' ක්‍රියාවලියක් වන බැවින් මැතිවරණ ප්‍රකාශනයෙන් අපේක්ෂිත ''මැදිකාලීන'' ආර්ථික සෞභාග්‍යය ලබාදීමට එය අපොහොසත් වේ. අපේක්ෂිත අති විශාල අයෝජනයට සැලකිය යුතු දායකත්වයක් කළ හැකි තරමට දේශීය ව්‍යවසායක පන්තිය විශාලද නොවේ. මැතිවරණ ප්‍රකාශනයෙන් අවධාරණය කෙරෙන සංවර්ධන උපාය මාර්ගය ද විදේශීය ආයෝජන වලට එරෙහිව දේශීය ආයෝජනවලට අනුග්‍රහය දක්වයි. නමුත් ආර්ථිකයේ විශාල ඉදිරි පිම්මක් සඳහා විදේශීය ආයෝජන අත්‍යවශ්‍ය වන අතර, ඒ මගින් දේශීය ඉතිරිකිරීම් පරතරය පියවා ගත හැකි වේ.

විය යුතු බවයි. ඇත්තෙන්ම, අවශේෂ ලෝකයට දැඩිලෙස සම්බන්ධ නොවූ ගෝලීය කේන්ද්‍රස්ථානයක් පැවතිය නොහැකිය. එමෙන්ම, ලෝක වෙළඳපොළට යොමු නොවූ ව්‍යවසායකත්ව දියුණුවක් ද පැවතිය නොහැකිය.

## ලංකාව ගෝලීය කේන්ද්‍රස්ථානයක් වශයෙන්...

දේශීය ව්‍යවසායකයින් ජාත්‍යන්තර කරණයට මුහුණ දිය හැකි සේ වර්ධනය විය යුතුය. ඒ අනුව ඔවුහු ජාත්‍යන්තර වෙළඳපොළට පිවිසීමෙන් දේශීය ආර්ථිකය පුළුල් කරනු ඇත. කෙසේ වෙතත්, මෙහි වැරදි උපකල්පනය නම් එවන් දේශීය ව්‍යවසායකත්වය ගොඩ නැගෙන්නේ ''රජයේ සහායයෙන් '' මිස ''ප්‍රතිපත්ති පරිසරය'' තුළ නොවන බවයි. අනෙක් අතට දේශීය ව්‍යවසායක පන්තිය ගොඩනැගීම ''දිගුකාලීන'' ක්‍රියාවලියක් වන බැවින් මැතිවරණ ප්‍රකාශනයෙන් අපේක්ෂිත ''මැදිකාලීන'' ආර්ථික සෞභාග්‍යය ලබාදීමට එය අපොහොසත් වේ. අපේක්ෂිත අති විශාල අයෝජනයට සැලකිය යුතු දායකත්වයක් කළ හැකි තරමට දේශීය ව්‍යවසායක පන්තිය විශාලද නොවේ. මැතිවරණ ප්‍රකාශනයෙන් අවධාරණය කෙරෙන සංවර්ධන උපාය මාර්ගය ද විදේශීය ආයෝජන වලට එරෙහිව දේශීය ආයෝජනවලට අනුග්‍රහය දක්වයි. නමුත් ආර්ථිකයේ විශාල ඉදිරි පිම්මක් සඳහා විදේශීය ආයෝජන අත්‍යවශ්‍ය වන අතර, ඒ මගින් දේශීය ඉතිරිකිරීම් පරතරය පියවා ගත හැකි වේ.

ඒක පුද්ගල ආදායමේ වෙනස්වීම 1991-2009




### උද්ධමනයට ඒක පුද්ගල ආදායම වැඩිකළ හැකිය

ඇමෙරිකානු ඩොලර් එකක් සඳහා අඩු රුපියල් අගයකින් යුතු හරය (විනිමය අනුපාතය) භාවිතා කරමින් ඒක පුද්ගල ආදායම වැඩිකර පෙන්විය හැකිය. විනිමය අනුපාතය දේශීය උද්ධමනයට ප්‍රතිචාර දක්වයි. 2000-2003 කාල පරිච්ඡේදය තුළදී සාමාන්‍ය උද්ධමනය සියයට 9ක් වූ අතර, ඒ අනුව විනිමය අනුපාතයද සියයට 8කින් පමණ පිරිහුණි. 2004-208 කාල පරිච්ඡේදයේදී සාමාන්‍ය උද්දමන අනුපාතිකය සියයට 15ක් වූ නමුත්, විනිමය අනුපාතය පිරිහුණේ සියයට 2.4 කින් පමණි. ඒ අනුව, ඉලක්කම් වලින් වැඩි වී ගිය ඒකපුද්ගල ආදායම තුලින් ජනතාවගේ සාමාන්‍ය මිලදී ගැනීමේ හැකියාව (ක්‍රය ශක්තිය) වැඩි වූ බවක් නොකියැවේ.

## රජයේ කාර්යභාරය: ජයග්‍රාහකයින් තේරීම

මැතිවරණ ප්‍රකාශනයෙන් පිලිබිඹු වන ආකාරයට ආණ්ඩුවේ කාර්යභාරය වන්නේ අපනයන වර්ධනය සඳහා ''තෝරාගත් අංශ වලට මැදහත් වීමයි''. වෙළඳපොළ තත්වය නිවැරදි කර ගැනීම වෙනුවට, රජයේ මැදහත් වීම නිවැරදි කර ගැනීමේ සංවර්ධන උපාය මාර්ගයෙහි මූලික දුර්වලතා කිහිපයක් ඇත. (i) එය වෙළෙඳපොළ ක්‍රමය තුළ පුළුල් විය හැකි අංශ නොසලකා හරියි. (ii) කුඩා ප්‍රතිලාභයක් වෙනුවෙන් විශාල බරක් බදු ගෙවන්නන් මත පැටවීමට එය හේතුවේ. (iii) එයින් රජය හා ව්‍යවසායක පන්තිය අතර, ''අපිරිසිදු සබඳතා'' ඇතිවීමට ඉඩකඩ පුළුල් වේ. මේ සියල්ලෙහි ප්‍රතිඵලය වන්නේ, රජය විසින් තෝරාගන්නා ජයග්‍රහකයින් පෙළකට පමණක් දියුණුවේ මාවත විවෘත වන පරිදි සම්පත් නාස්තිකාරී ලෙස බෙදී යාමයි. එමෙන්ම, මෙම උපාය මාර්ගය තුළ බිහිවන ආර්ථික කටයුතු බොහොමයකට රජයේ සහායකින් තොරව තිරසාර පැවැත්මක් ද නොමැති බව, නැගෙනහිර හා අග්නිදිග ආසියානු රටවල අත්දැකීම් වලින් ද පැහැදිලි වී තිබේ.

විදේශීය සෘජු ආයෝජන ප්‍රවාහය සහ එහි එකතුව (සමුච්චිතය) 2008

| | වාර්ෂික ආයෝජන ප්‍රවාහය (ඩොලර් බිලියන) | ආයෝජන සමුච්චිතය (ඩොලර් බිලියන) |
|---|---|---|
| නැගෙනහිර ආසියාව | 187.0 | 1363.1 |
| චීනය | 108.3 | 378.1 |
| හොංකොං | 63.0 | 835.8 |
| ගිනිකොණ ආසියාව | 60.0 | 663.0 |
| මැලේසියාව | 8.0 | 73.3 |
| සිංගප්පූරුව | 22.7 | 326.1 |
| වියට්නාම් | 8.1 | 48.3 |
| දකුණු ආසියාව | 50.7 | 186.1 |
| ඉන්දියාව | 41.6 | 123.3 |
| පකිස්තානය | 5.4 | 31.1 |
| ශ්‍රී ලංකාව | 0.8 | 4.3 |

### ලංකාව සිත්ගත් ආයෝජන කේන්ද්‍රස්ථානයක් නොවේ

මේ දක්වා ලංකාව විදේශ ආයෝජන සඳහා සිත් ඇද ගන්නා සුළු ආයෝජන කේන්ද්‍රස්ථානයක් වී නොමැත. පසුගිය අවුරුදු 30 ක පමණ කාලය තුළ ඒකරාශී වී ඇති මුළු විදේශ ආයෝජන ප්‍රමාණය ඩොලර් බිලියන 4.3 ක් පමණි. ලංකාවට වඩා බොහෝ පසුව වෙළෙඳපොළ ප්‍රතිපත්ති අනුගමනය කිරීමට පටන්ගත් වියට්නාමය වැනි රටක් පවා එක වර්ෂයකට පමණක් ඩොලර් බිලියන 8 ක පමණ විදේශ ආයෝජන ප්‍රවාහයක් ලබයි. ලංකාව වාර්ෂික විදේශ ආයෝජන ප්‍රවාහය අතින් ආසියාවේ ඉතාමත්ම දිළිඳු රටකි.

# ආර්ථික සෞභාග්‍ය කරා...

ලංකාවේ මැදිකාලීන ආර්ථික සෞභාග්‍යය අත්පත් කරගැනීම පදනම් වන්නේ මූලික කරුණු කිහිපයක් මතය. ගෝලීය සම්බන්ධතාව සහ ගෝලීය තරගකාරීත්වය ශක්තිමත් කිරීම එහි මූලික අවශ්‍යතාව වන අතර, ඒ සඳහා ආර්ථිකයේ පුළුල් විවෘත භාවය අත්‍යවශ්‍ය වේ. මෙම තත්වය සහතික කිරීමට  සරල හා පැහැදිලි ක්‍රියාපටිපාටීන් අවශ්‍ය වන අතර, රටෙහි සාර්ව ආර්ථික පදනම ශක්තිමත් විය යුතුය. මේ සියල්ල සඳහා ඍජු හා දැඩි පියවරක් ඉදිරියට තබමින් ආරම්භ විය යුතු ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් අඛණ්ඩව ඉදිරියට යා යුතු වේ. මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි අඩංගු විය යුතු මූලික ලක්‍ෂණ පහත දැක්වේ.

## සංවර්ධන උපායමාර්ගය

ව්‍යවසායක සංවර්ධනය, ප්‍රතිපත්ති රාමුව තුළ පවත්නා නිවැරදි සානුබලයන් (දිරිගැන්වීම්) මත ස්වාභාවිකව සිදුවන ක්‍රියාවලියකි. එබැවින් ආයෝජන ප්‍රවාහයන්, ව්‍යවසායක සංවර්ධනයත් ප්‍රතිපත්ති පරිසරය තුළ බිහිවීම මිස, ආණ්ඩුව තුළින් බිහිවීම අපේක්‍ෂා නොකෙරේ.

i. ප්‍රතිපත්ති පරිසරය නිෂ්පාදන අංශ අතර වෙනස්කම් ඇති කරන ක්‍රමයක් නොවිය යුතුය. මෙයට හේතුව තෝරාගත් නිෂ්පාදන අංශ  වලට විශේෂ සැලකිලි දක්වන විට, පුළුල් වීමේ විභවතාව ඇති අංශ හා ඒවායෙහි ආයෝජනයත්, ඒ තුළින් ව්‍යවසායක දියුණුවත් අධෛර්යමත් විය හැකි නිසාය. මෙම කොන්දේසිය විදේශ ආයෝජන සඳහා ද අදාල වේ. අව්‍යාජ ආයෝජකයින් බලාපොරොත්තු වන්නෙ යහපත් ආර්ථික ප්‍රතිපත්ති හා නීතිරීති පද්ධතියක් මිස විශේෂ සානුබලයන් (දිරිගැන්වීම්) නොවේ.

ii. දේශීය කෘෂි අංශයද තරගකාරී ආයාත හමුවේත් ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළත් තරගකාරී විය යුතුය. එම අංශය තුළ තිරසාර ආදායම් වර්ධනය සහතික කළ හැක්කේ ඒ තුළින් මිස රජයේ සහන හා ආයාත බදු වලින් නොවේ. අඩුතරමින් ක්‍රමානුකූලව හෝ ලංකාවේ කෘෂි අංශයේ පවතින ව්‍යුහාත්මක දුර්වලතා වන මුල්බැස ඇති කෘෂි ඉඩම් බෙදී ඇති ක්‍රමය, ඉඩම් පරිහරණ රටාව සහ එහි දේපල අයිතිය පිළිබඳ ගැටළු නිරාකරණය විය යුතුය.

iii. ලංකාවේ ආර්ථිකයට වැඩි දුරක් ගමන් කළ නොහැකි තරම් දේශීය වෙළෙඳපොළ ඉතා කුඩා බැවින්, සංවර්ධන උපාය මාර්ගයේ මූලික අවධානය යොමු විය යුත්තේ ගෝලීය වෙළෙඳපොළට හා අපනයන ප්‍රවර්ධනයටය. මෙම උපාය මාර්ගය, ලංකාව තුළ  ගෝලීය කේන්ද්‍රස්ථානයක් බිහි කිරීමේ ක්‍රියාකාරී සැලසුම සමග මනා ලෙස ගැලපේ.

iv. රජයේ මූලික අවධානය යොමුවිය යුත්තේ ආර්ථිකයේ නිෂ්පාදන පිරිවැය අඩුකිරීමටත්, නිෂ්පාදන තරගය හා තරගකාරීත්වය වැඩි දියුණු කිරීමටත් ය. මෙම ක්ෂේත්‍රයෙහි ඇති මූලික ප්‍රශ්න බොහෝවිට පැන නැගෙන්නේ, ආණ්ඩුවේ මැදහත් වීම, රෙගුලාසි පද්ධතිය, යටිතල පහසුකම්වල අඩුපාඩුව, වෙළෙඳපොළ අවහිරතා සහ මානව සම්පත් හිඟකම ආදී කරුණු තුළිනි. මෙම ගැටළු නිරාකරණය කිරීමේ මූලික වගකීම රජය සතුව පවතී.

v. යටිතල පහසුකම් හා විශාල ආයෝජන ව්‍යාපෘතිවල ආයෝජනයට, පෞද්ගලික අංශයට ඍජුවමත්, පෞද්ගලික හා රාජ්‍ය අංශවල හවුල්කාරීත්වයටත් ඇති ඉඩකඩ පුළුල් කිරීමට රජයට හැකියාව ඇත. ඒ අනුව අධිවේගී මාර්ග, දුම්රිය මාර්ග, වරාය, ගුවන් තොටුපොළ, බල ශක්තිය හා වෙනත් අංශවල ආයෝජනයට පෞද්ගලික අංශයට දොර විවෘත කළ හැකිය. මෙය ආයෝජන ප්‍රවර්ධනය වේගවත් කිරීමට මෙන්ම, රාජ්‍ය අයවැය බර අඩුකර ගැනීමට හේතුවේ.

# නීතිරීති රාමුව:

රටක නීතිරීති රාමුව සහ රාජ්‍ය නිලධාරි ක්‍රමය ව්‍යාපාරික පිරිවැය, ආයෝජන ප්‍රවර්ධනය සහ ව්‍යවසායක සංවර්ධනය තීරණය කරන මූලික සාධකයකි. ඇත්තෙන්ම ආර්ථිකයක ශීඝ්‍ර වර්ධනය තුළින් සරල හා පැහැදිලි රෙගුලාසි සඳහා වැඩිවන ඉල්ලුමත් ජනිත කරයි.

i. ව්‍යාපාර කිරීමේ අවස්ථික පිරිවැය හා ගණුදෙනු පිරිවැය අඩුකිරීමට සරලවූත්, තාර්කික වූත් නීතිරීති පද්ධතියක් හා රාජ්‍ය සේවයකුත් අවශ්‍ය වේ. මෙම ක්ෂේත්‍රයෙහි ප්‍රතිසංස්කරණ ලංකා ආර්ථිකයේ ජාත්‍යන්තර තරගකාරීත්වය වැඩිදියුණු වීමට හේතුවේ. එය ලංකාව නාවික, ගුවන්, වාණිජ, බලශක්තිය හා දැනුම අතින් ගෝලීය කේන්ද්‍රස්ථානයක් බවට පත් වීමට අවශ්‍ය වේ.

ii. ආර්ථික හා කළමණාකරණ මූලධර්මයන් අනුව ක්‍රියාකිරීමට රාජ්‍ය ව්‍යවසායයන්ට ඉහළ ස්වාධීනතාවයක් අවශ්‍ය වේ. රාජ්‍ය ව්‍යවසායයන්හි මූලික ප්‍රශ්නය අයිතිය නොව කළමනාකාරීත්වයයි. රාජ්‍ය පරිපාලන කටයුතුවල නියුක්ත ආණ්ඩුවේ ආයතනවලට ද නූතන ඉල්ලුමට ගැලපෙන සේවයක් සැපයීමට ඉහළ ස්වාධීනතාවක් ද, සානුබල (දිරිදීම්) ව්‍යුහයක්ද අවශ්‍යය.

iii. නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක් මනා ලෙස කළමනාකරණය කිරීමට අවශ්‍ය මූලික සාධකය වන්නේ නීතිය ක්‍රියාත්මක වීම මිස අනෙකක් නොවේ. කෙනෙකුගේ හෝ සමස්ත ජන සමාජයේ ආර්ථික නිදහසට, තවෙකකුගේ (රාජ්‍ය ද ඇතුලුව) බලපෑම් අවම කරගත හැක්කේ නීතිය ක්‍රියාත්මක වීම තුළිනි. නීතිය ක්‍රියාත්මකවීමේ දුර්වලතාව නිසා මේ වනවිටත් මුල්බැස ගිය ආර්ථික අවුලකට හා දූෂණයට මාර්ගය විවෘත වී ඇත. තව තවත් ප්‍රමාද වීමෙන්, මෙම දුෂ්කරතා ජයගැනීම තවතවත් දුෂ්කර වනු ඇත.

# සාර්ව ආර්ථික පදනම

භාණ්ඩ මිල ගණන්, පොලී අනුපාත හා විනිමය අනුපාත ස්ථායි  හා නම්‍ය විය යුතු වේ. රජය හෝ මහ බැංකුව එම වෙළෙඳපොළවල් තුළ අනවශ්‍ය ලෙස මැදිහත්වන්නේ නම්, ස්ථායිතාව හා නම්‍යතාව හාත්පසින් ප්‍රතිවිරුද්ධ ලක්‍ෂණ දෙකක් බවට පත් වේ.ස්ථායිතාව රැක ගැනීමට උත්සාහ කරන විට නම්‍යතාව නැතිවන අතර, නම්‍යතාව රැක ගැනීමට උත්සාහ කරන විට ස්ථායිතාව නැති වේ. එමෙන්ම සාර්ව ආර්ථික පදනම, ආයෝජන විශ්වාසය වැඩි දියුණු වන පරිදි දිගුකාලීනව තිරසාර විය යුතු අතර, අවිනිශ්චිත නොවන සේ පුරෝකථනය කළහැකි වූවක් විය යුතුය.

i. කළමණාකරණය කරගත හැකි අයවැය හිගයක් අරමුණු කොටගත්, රජයේ අයවැය තත්වය ආදායම් ලැබීම හා වියදම් කිරීම යන දෙයාකාරයෙන්ම වැඩි දියුණු විය යුතුවේ. රජයේ ආදායම් ලැබීම සම්බන්ධයෙන් සංකීර්ණ හා අනේකවිධ බදු වර්ග ඉවත් කොට බදු ක්‍රමය සරල කළ යුතුවේ. සියළුම ආකාරයේ ආදායම් උපයන්නන් සහ වත්කම් හිමියන් ඇතුලත් කරනු ලදුව, බදු ආවරණය පුළුල් විය යුතුය.

ii. රජයේ වියදම් දැරීම සම්බන්ධයෙන්, පිරිවැය ඵලදායිබව, විනිවිදබව හා වගකීම් සහිත බව වැඩිදියුණු වන පරිදි, දැනට පවත්නා නාස්තිකාරී හෝ ඵලදායි නොවන වියදම් රටාවන් ප්‍රතිසංස්කරණය කළයුතු වේ. රාජ්‍ය ව්‍යවසායයන් හා අනෙකුත් රාජ්‍ය ආයතන වලට ඉහළ මට්ටමේ කළමනාකරණ ස්වාධීනතාව පවරා දී ප්‍රතිසංවිධානය කළයුතු අතර, එය රජයේ අයවැය තත්වය යහපත් කර ගැනීමට ද හේතු වේ.

iii. අයවැය සම්බන්ධයෙන් රජයේ හික්මීම මුදල් සම්බන්ධයෙන් මූල්‍ය අධිකාරියේ හික්මීමට ද හේතුවේ. මේ අනුව රටේ පොලී අනුපාතයන් අඩු හා ස්ථාවර විය යුතු අතර, ඒවා රාජ්‍ය මැදහත් වීමට වඩා වෙළෙඳපොල බලවේගයන්ට ප්‍රතිචාර දක්විය යුතුවේ.

iv. විදේශ විනිමය අනුපාතයද ස්ථායි මෙන්ම නම්‍යශීලී විය යුතුය. එය නම්‍යශීලී විය යුත්තේ විනිමය වෙළෙඳපොළ බලවේගයන්ට අනුව මිස, අනවශ්‍ය පරිපාලනයන්ට ප්‍රතිචාර දක්වීමෙන් නොවේ. විදේශ විනිමය ඉපයීම, අපනයන ප්‍රවර්ධනය මිස පෞද්ගලික සංක්‍රාම මතත් (ජංගම ගිණුමේ) විදේශ ආයෝජන මිස විදේශ ණය මතත් (ප්‍රාග්ධන ගිණුමේ) රැඳීම අඩුවිය යුතු වේ.

කළයුත්තේ කුමක්දැයි තෝරා බේරා ගැනීම සාමාන්‍යයෙන් දුෂ්කර කාර්යයකි. මෙයට පහසු මගක් වන්නේ වත්මන් ජාත්‍යන්තර සංඛ්‍යයන වාර්තා පදනම් කර ගැනීමයි. Doing Business Report, Global Competitiveness Report, Economic Freedom Report, World Investment Report, Corruption Perception Report. මෙම ජාත්‍යන්තර වාර්තා මගින් අදාල ක්ෂේත්‍රය තුළ රටක තත්වය කුමක්දැයි අවශේෂ ලෝකයට හෙළි කරයි. මෙම සියළු වාර්තාවල ලංකාව පහළ මට්ටමේ රටක් වශයෙන් පෙළගැසී ඇති බැවින් ප්‍රතිපත්ති සම්පාදනයේදී ''ඉහළ මට්ටමේ රටක'' තත්වයට ළඟවීමට කුමක් කළයුතු දැයි මාර්ගෝපදේශකත්වයක් ලබාගත හැකි වේ.

ව්‍යාපාර කිරීමේ පහසුව පෙළගැසීමේ දර්ශකය

| | ලංකාවේ පෙළගැසීම | සිංගප්පූරුවේ පෙළගැසීම |
|---|---|---|
| ව්‍යාපාරයක් ආරම්භ කිරීම | 29 | 10 |
| අවසර ලබා ගැනීම | 161 | 2 |
| සේවකයින් බඳවා ගැනීම | 110 | 1 |
| දේපොළ ලියාපදිංචි කිරීම | 141 | 16 |
| ණය ලබා ගැනීම | 68 | 5 |
| ආයෝජකයින් ආරක්‍ෂා කිරීම | 70 | 2 |
| බදු ගෙවීම | 164 | 5 |
| පිටරටවල් සමග වෙළඳාම් කිරීම | 66 | 1 |
| ගිවිසුම්වලට එළඹීම | 135 | 14 |
| ව්‍යාපාර වසා දැමීම | 43 | 2 |
| සමස්ත පෙළගැසීම | 102 | 1 |

**ලංකාවේ ව්‍යාපාර කිරීම කෙතරම් පහසුද?**

ලෝකයේ රටවල් 181 ක් අතරින්, ව්‍යාපාර සඳහා ලංකාවට වඩා හොඳ ආයෝජන පරිසරයක් ඇති රටවල් 101 ක් තිබේ. ව්‍යාපාරික කටයුතු සඳහා ලෝකයේ හොඳම රට වශයෙන් පළමු ස්ථානයට පැමිණ ඇත්තේ සිංගප්පූරුවයි. ඒ හැරුණු කොට හොඳම රටවල් 10 අතරට නවසීලන්තය, ඇමෙරිකාව, හොංකොං, ඩෙන්මාර්කය, එක්සත් රාජධානිය, අයර්ලන්තය, කැනඩාව, ඕස්ට්‍රේලියාව සහ නෝර්වේ අයත් වේ. ආසියානු කලාපය තුළ ජපානය, තායිලන්තය, මැලේසියාව, කොරියාව, මාලදිවයින, පකිස්ථානය, චීනය සහ වියට්නාමය යන රටවල් ද ලංකාවට වඩා බොහෝ ඉදිරියෙන් සිටී.